ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

අත්‍යවශ්‍ය **ආහාර** දාරව්‍ය සැපයීම සඳහා **NCEL** සහ **COOPFED** අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබේ

අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයුම, ආහාර සුරක්ෂිතතාවය සහ සමූපකාර සංවර්ධනය යන අංශ තුළ සහයෝගීතාවය වර්ධනය කරගැනීම සඳහා ඉන්දියාවේ සමූපකාර අපනයන සංගමය (NCEL) සහ ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සම්මේලනය (COOPFED) අතර අවබෝධතා ගිවිසුමකට අද දින කොළඹ දී අත්සන් තැබිණ.

2. මමෙ අවබෝධතා ගිවිසුම NCEL හි කළමනාකාර අධ්‍යක්ෂ ශ්‍රී උනුපෝම් කෞශික් මහතා සහ COOPFED හි සභාපති ආචාර්ය ශාන්ත ජයරත්න මහතා අතර අත්සන් තැබුණු අතර මමෙ අවස්ථාවට ශ්‍රී ලංකාවේ වළෙඳෙ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා ද සහභාගි වූහ.

3. මමෙ අවබෝධතා ගිවිසුම සමූපකාර ජාල භාවිතා කිරීම සහ ආයතන දිවිත්වයහෙි ප්‍රවීණතාවය භාවිතා කිරීම සඳහා රාමුවක් ලසෙ ක්‍රියා කරනු ඇත. මමෙ හවුල්කාරිත්වය යටතේ අත්‍යවශ්‍ය ආහාර අයිතම NCEL හි සමූපකාර ජාල හරහා ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට සැපයනු ඇති අතර ඒ අනුව හිඟයන් අවම කිරීම සහ දැරිය හැකි මිලකට භාණ්ඩ ලබා ගැනීමට ඇති අවස්ථාවන් ඉහළ නංවනු ඇත.

4. කෘෂිකාර්මික සහ ආහාර දාරව්‍යයන් සැපයීමට අමතරව, මමෙ අවබෝධතා ගිවිසුම වළෙඳෙපොළ තොරතුරු සහ මනා භාවිතයන් හුවමාරු කර ගැනීම, ධාරිතා සංවර්ධනය, තාක්ෂණික සහයෝගිතාවය, ගබඩාකරණය සහ ලොජිස්ටික් කටයුතු, සැපයුම් දාම කළමනාකරණය සහ ඩිජිටල් වේදිකා යනාදිය සම්බන්ධයනේ සහයෝගීතාවය වර්ධනය කිරීමට ද අරමුණු කරයි. එසේම, එය දරෙටහෙි සමූපකාර ක්ෂේත්‍රයන් දකෙ අතර ආයතනික සබඳතා ද ශක්තිමත් කරනු ඇත.

5. NCEL යනු සමූපකාර ක්ෂේත්‍රයේ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා ඉන්දීය රජයේ සමූපකාර අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද ආයතනයකි. ශ්‍රී ලංකාවේ පාරිභෝගික සමූපකාර සමිති අතර ප්‍රධාන සංවිධානය වන COOPFED සමඟ එහි

හවුල්කාරිත්වය ඉන්දීය සැපයුම්කරුවන් සහ ශ්‍රී ලංකා පාරිභෝගිකයන් අතර සබඳතා ශක්තිමත් කරනු ඇත.

6. මමෙ අවබෝධතා ගිවිසුම අන්සන් තැබීම මගින් ආහාර සුරක්ෂිතතාවය, මනාව ඔරොත්තු දෙන සැපයුම් දාම සහ නිෂ්පාදකයන්ට සහ පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලබා දීම යනාදිය වෙත අවධානය යොමු කරමින් ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික සබඳතා ශක්තිමත් කිරීමහි ලා තවත් පියවරක් සනිටුහන් කරෙේ.

***

කොළඹ
2026* ඔක්තෝබර් *06